# බහුකෝටික ප්‍රස්තුතයන්ගේ ඥානවිභාගාත්මක අගය පිළිබඳ විමසුමක්

**සමන්ත ඉලංගකෝන්**[1]

කිසියම් දෙයක පැවැත්ම පිළිබඳව ප්‍රකාශ කිරීමේ සාමාන්‍යයෙන් ව්‍යවහාරික භාෂාවේ අප භාවිත කරන්නේ එක්කෝ ඇත අර්ථය ලබාදෙන ප්‍රස්තුත ය. නැතහොත් නැත අර්ථය ලබාදෙන ප්‍රස්තුත ය. ඒවාට ද්විකෝටික ප්‍රකාශනයැයි කියනු ලැබේ. බටහිර තර්ක ක්‍රමය මෙන්ම ඥාන විභාගය ද පදනම් ඇත්තේ මෙම ද්විකෝටික මෙන්ම දෙඇගයුම් ප්‍රකාශන මත ය. එයට සාපේක්ෂව පෙරදිග වැසියන්ගේ චින්තන ක්‍රමය සකස් කිරීම සඳහා පදනම් වූ සුවිශේෂී බහුකෝටික ප්‍රකාශන කිහිපයක් පිළිබඳව මෙහි අපගේ අවධානය යොමු කරනු ලැබේ. ඒවා අතර;

1. තෛරාශික ආජීවකයන්ගේ ත්‍රිකෝටික නය ක්‍රමය
2. ජෛනයන්ගේ ස්‍යාද්වාදය
3. සංශයවාදීන්ගේ පංච නිශේධන ක්‍රමය
4. බෞද්ධ චතුෂ්කෝටිය

යන බහුකෝටිකයන්ගේ ඇති ඥාන විභාගීය පදනම පිළිබඳව මෙහි විමර්ශනය කිරීමට අපේක්ෂිත ය.

පෙරදිග දර්ශනයේ එන ඥාන විභාගයේ මෙන්ම තර්ක ශාස්ත්‍රයේ ද අනන්‍යතාව ප්‍රකට කෙරෙන බහුකෝටික ප්‍රකාශන පෙර’පර දෙදිග තර්ක ශාස්ත්‍රඥයන්ගේ සහ දාර්ශනික විචාරකයන්ගේ නොමඳ අවධානය සහ විචාරක්ෂියට යොමුව තිබේ. පැරණි පෙරදිග ආගමික ශාස්තෘවරුන් හා දාර්ශනිකයන් සිය ආගමික හා දාර්ශනික ප්‍රස්තුත විග්‍රහ කිරීමේදී භාවිත කළ බහුකෝටික ප්‍රස්තුතයන්ගේ ඥාන විභාගාත්මක අර්ථය පිළිබඳව මාගේ විශේෂ අවධානය යොමු කිරීමට මෙම පර්යේෂණ පත්‍රයේදී උත්සාහ කරනු ලැබේ.

ප්‍රමුඛ පදඃ ද්විකෝටිකය, සංශය,ස්‍යාද්, නිශේධන

**Title:** An Examination of the Epistemological Significance of Multi Cornered Expository

**Keywords:** Multi Cornered Expository, Dual concerned Expository, Buddhism

---

[1] සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අංශය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
Email: ilangasamanta@yahoo.com